## "A Study of the Curative Ritual - Kem as Practised by the Sinhalese, with Special Reference to 'Yogarnavaya'"

### Summary

From time immemorial, man has practised rituals for a variety of purposes. Beliefs and superstitions were part and parcel of man and society. Man needed rituals to overcome fear of the unknown and to protect himself from evil spirits and forces. Even disease was believed to be the work of devils (*yaksha*) and evil spirits (*Preta*).

In the case of the Sinhalese too, they had their own beliefs, superstitions and rituals. In addition they had a wealth of knowledge of herbal medicine and medical practices. However, evidence indicates that in the treatment of patients, medicines and rituals have gained equal importance.

One of these rituals in the treatment of patients is recognised as *'Kem'* (කෙම්). This is a practice or a ritual performed by the patient, the physician and sometimes by the entire house - hold. The practice of 'Kem' takes different forms, but most often it is a form of enforcing discipline especially with regard to cleanliness and abstaining from deeds which are considered sinful.

There had been many writings and works on the practices of indigenous medicine and the practices associated with 'Kem'. One such work is a text entitled 'Yogarnavaya' written during the Dambadeniya period by Venerable Buddha Putra of the *Mayurapada Pirivena.*

Reference has been made to the practice of 'Kem' in many other literary works such as *'Saddharmaratnavaliya'* and *'Pujavaliya'.* The word 'Kem', in these texts, has been referred to as to mean 'healing' while different meanings are attributed in several other classical Sinhala literary works.

This paper examines how *'Yogarnavaya'* describes various forms of the practices of *'Kem'* by the Sinhalese of the mediaeval period, and the beneficial effects of these practices.

It is believed that the sum total effect of the herbal medicines, and the practice of *'Kem'*, is the curing of the patient both physically and psychologically.

**Prof. Kusuma Karunaratne**
Senior Professor

## 'යෝගාර්ණවය' ඇසුරෙන් හෙළි වන පරිදි සිංහල ජනයාගේ චිකිත්සක අභාචාර - 'කෙම්' ක්‍රම පිළිබඳ විමර්ශනයක්

**මහාචාර්ය කුසුමා ඊ කරුණාරත්න**

*ජ්‍යෙෂ්ඨ මහාචාර්ය,*

*සිංහල අංශය,*

*කොළඹ විශ්වවිද්‍යාලය.*

---

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ම මිනිසා ස්වකීය අභිමතාර්ථ සාධනයෙහි ලා විවිධ අභිචාර විධි උපයෝගී කර ගත් බව පැහැදිලිය. මිනිසා සිය දෛනික ජීවිතයෙහි දී ඉටු කළ අනේකවිධ කාර්‍යයන් තුළට මෙම අභිචාර විධි ද අන්තර්ගත වී පැවතුණි. මිනිස් ජීවිතය කෙරෙහි බලපෑ අදෘශ්‍යමාන බලවේගයන්ගෙන් ආරක්ෂාව සලසා ගනු වස් ඔවුහු විවිධාකාර වත් පිළිවෙත්වලට යොමු වූහ. විශේෂයෙන් ම ලෙඩ රෝග සමනය කර ගැනීමෙහි ලා එදා පටන් ම පුරුදු පුහුණු කරනලද එබඳු අභිචාර විධි හා වත් පිළිවෙත් රාශියක් මිනිස් ශිෂ්ටාචාරය තුළින් හඳුනා ගත හැකි වී ඇත.

සිංහල සමාජය විෂයයෙහි ගෙන බැලුව ද එදා සිට අද දක්වා ම භාවිත වන එබඳු වත් පිළිවෙත් සංඛ්‍යාව අල්ප නොවන බව පෙනේ. සමාජය විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුවට පා තබා සිටින නූතන අවධියෙහි මෙන් නොව විද්‍යා ඥානය නමැති ආලෝකය පහළ නොවී පැවති අතීත යුගවල මිනිසාට රෝග නිදානය හෝ රෝග නිවාරණය පිළිබඳ ව සිය අත්දැකීම් තුළින් ම දැන හඳුනා ගැනීමට සිදු විය. ඒ අනුව යමින් පිළිගත් හා ක්‍රියාත්මක කළ ප්‍රතිකාර විධි සමග ම සමාජය තුළ ප්‍රචලිත වී පැවති විවිධ ඇදහිලි විශ්වාස හා අනුබද්ධ ව ඉටු කෙරුණ අභිචාර විධි ද රාශියක් සිංහල ජනයා සතු ව පැවතුණි.

සෙල්ලිපි හා ජනප්‍රවාදවලින් ද සනාථ වන පරිදි පුරාණ අවධිවල පටන් ම වෛද්‍ය ක්‍රම පිළිබඳ දැනුමක් ද සිංහලයා සතු විය. ආර්ය ජනයා දඹදිව සිට මෙහි පැමිණෙද්දී එරට පැවති වෛද්‍ය ක්‍රම ඔවුන් මගින් මෙරටට ද පුරුදු පුහුණු කරවන්නට ඇතැයි සිතීම දුෂ්කර නොවේ. කල් යාමේ දී මෙරට වෛද්‍ය ක්‍රමය ද දියුණු වූවා පමණක් නොව මහජනයාගේ සෞඛ්‍ය වර්ධනය සඳහා අවශ්‍ය විධි විධාන, පාලක පක්ෂයේ අනුග්‍රහය ද ලබමින් සැලසෙන්නට ඇති බවට සාක්ෂි මහාවංශය වැනි මූලාශ්‍රවලින් හෙළි වෙයි.[1]

ක්‍රි. පූ. අවධිවල වෛද්‍ය කටයුතුවල නිරත වූවන් සිටි බවට, "මහරජශ ගාමිණි තිශශ වෙජ බමණ ගොබුතිය ලෙණෙ ශගශ" යන ශිලාලිපි පාඨය සාක්ෂි දරයි.[2] විශේෂයෙන් ම විහාරවාසී භික්ෂූන් වහන්සේලාගේ සෞඛ්‍ය කටයුතු කෙරෙහි ද එකල අවධානය යොමු ව තිබූ බවට ලැබී ඇති තොරතුරු අනුව පෙර දවස මෙරට දියුණු වෛද්‍ය ක්‍රමයක් පැවති බව තව දුරටත් සනාථ වෙයි. තවත් බොහෝ අවස්ථාවල දී වෙදුන් පිළිබඳ තතු සෙල්ලිපිවලින් ම හමු වෙයි. "...ශ පුත වෙජ තිශහ ලෙණෙ" යන ලිපි පාඨයෙන් දක්වෙනුයේ තිස්ස නම දරූ වෛද්‍යවරයකු ගැනයි.

වංශකථාවල එන තොරතුරු පැරණි සිංහලයා වෛද්‍ය ක්‍රම පිළිබඳ දැනුම හා හැකියාව අතින් දියුණු තත්වයක සිටි අයුරු කියා පායි. ක්‍රි. ව. 5 වන ශත වර්ෂයේ රජ කළ බුද්ධදාස රජු නාගයකුගේ උදරයේ හටගෙන තිබූ ගෙඩියක් පලා බෙහෙත් කොට එම සර්පයා සුවපත් කළ අයුරු චූලවංශය පෙන්වා දෙයි.[4] පැරණි සිංහල සමාජයේ වෛද්‍ය ක්‍රමය කොතරම් දියුණු වී පැවතියේ ද යත් මිනිසුන්ගේ රෝග පීඩාදිය සඳහා පමණක් නොව තිරිසනුන්ගේ නොයෙක් ආබාධ සුව කිරීම සඳහා ද ඔවුන් ප්‍රතිකාර දැන සිටි බව හෙළි වෙයි. බුද්ධදාස රජු මෙම අංශයෙහි ලා පෑ දක්ෂතා එතුමා විවිධ අවස්ථාවන්හි කරන ලද ප්‍රතිකාර ගැන හමු වන සටහන්වලින් පමණක් නොව වෛද්‍ය ශාස්ත්‍රය අළලා ලියන ලද පොත පතින් ද හෙළි පෙහෙළි වෙයි. එතුමා විසින් රචිත බව පෙනෙන "සාරාර්ථසංග්‍රහ" නම් වෛද්‍ය ග්‍රන්ථය මෙම කරුණ සනාථ කරයි.

සිංහලයන්ගේ ඉතිහාසයේ පසු අවධින්හි ද වෛද්‍ය අංශයෙහි ලා මෙබඳු හෝ මීටත් වඩා වැඩි දියුණු තත්වයක් කියා පාන සාක්ෂි සාහිත්‍ය ග්‍රන්ථ තුළින් ද අනාවරණය වන්නේය. දඹදෙණි යුගයේ විසූ සාමාන්‍ය ජනතාව අතර දියුණු වෛද්‍ය ක්‍රම තිබූ හෙයින් ම එකල ගැමි ජීවිතය ගැන පුළුල් දැනුමක් හා අවබෝධයක් ඇති ව ග්‍රන්ථ රචනා කළ ධර්මසේන හිමියන්ගේ කෘතියක් වන සධර්මරත්නාවලියට එම තොරතුරු ඇතුළත් වී ඇත්තේ මෙසේය.

"පය බරවායට පිටිකර බෙහෙත් බඳනා සේ"
"නිදන් බලා කරන පිළියමක් සේ"
"අවස්ථා පිළියම් දන්නා වෙදවරුන් නිදන් දන්නා සේ"
"විරේචනයෙන් දුර්වල වූ ශරීරයක් සෙනහ පානයෙන් සතපන්නා සේ"
"හුණු ඇත්තවුන්ට තියඹරා කන්ට කියන්නා සේ"

වෛද්‍ය ක්‍රම පිළිබඳ හැදෑරීම ශිෂ්‍යයන් විසින් කළ යුතු ව තිබූ බවට සාක්ෂි කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කාව්‍යවලින් ද සොයා ගත හැකිය. තොටගමුවේ විජයබා පිරිවෙනෙහි සිප් සතර හැදෑරූ ශිෂ්‍යයන්ට වෛද්‍ය ශාස්ත්‍රය ඉගෙනීමට ද අවස්ථාව සැලසුණ බවට පහත දැක්වෙන පද්‍ය සාක්ෂ්‍ය දරයි.

"මුනිවිරු දෙසූ සදහම් මෙන් ඇම    දවස
උවදුරු දුරැර රකිනුව සත් වග    වෙසෙස
පෙරැදුරු ඉසිවරන් පැවසූ නොයෙක    ලෙස
වෙදවරු දෙසතර පිරුවති එහි    සතොස"[5]

මේ අයුරින් අධ්‍යයන ආයතනවල ඉගැන්වූ විෂයයක් මගින් එකල සිංහලයාගේ වෛද්‍ය ක්‍රමය වඩාත් ප්‍රචලිත වී දියුණු වන්නට ඇති බව සිතා ගැනීම අපහසු නොවේ. විදේශීය ආභාසයන් මගින්, විශේෂයෙන් ම ඉන්දියානු බලපෑමෙන් ද මෙම වෛද්‍ය ක්‍රමය වඩාත් පුළුල් වී පැතිර ගිය බවට ද පිළිගත හැකි සාක්ෂි දක්නට ඇත. මීට පසු අවධින් වන විට වෙද පරම්පරා ගැන ද අසන්නට ලැබෙන හෙයින් වෛද්‍ය ක්‍රමය තව දුරටත් දියුණු වී තහවුරු වූ බවට සැකයක් නැත.

මේ අයුරින් සිංහල සමාජය තුළ කල් යාමේ දී පැතිර ගිය වෛද්‍ය ක්‍රමය අනුව රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ විවිධ ආකාරයන් පිළිගැනීමට ලක් ව තිබුණ බව ද පෙනේ. තව ද වෛද්‍ය ක්‍රමය හා සම්බන්ධ වී පැවතුණ නොයෙක් සාරධර්ම ගැන ද දැන ගන්නට ලැබේ. සාමාන්‍යයෙන් අධ්‍යයන කාර්‍ය්‍යයෙහි දී අපේක්ෂිත පරිදි මෙහි දී ද වෙදකම උගන්නා ශිෂ්‍යයා ගුරුවරයාහට කීකරුව යටහත් පහත් ව තම විෂයය හැදෑරිය යුතු යයි පිළිගැනුණි. වෛද්‍යවරයකු සතු ව තිබිය යුතු සේ සැලකුණ යම් යම් ගුණාංග හා කුසලතා ද විය. රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ දී වෙදකු හැම විට ම ඉතා පරීක්ෂාකාරී වීම හා කල්පනාකාරී වීම අත්‍යවශ්‍ය සේ සැලකුණි. රෝගියකුට ප්‍රතිකාර කිරීම ඇරඹීමට පෙර රෝග නිදානය සොයා ගැනීම පළමුවෙන් ම කළ යුත්තක් විය. රෝග නිදානය සෙවීමේ දී වෛද්‍යවරයෙකු හුදෙක් රෝගියා ගැන පමණක් විමසීම ප්‍රමාණවත් නොවීය. එබඳු රෝගයකට එම රෝගියා භාජන වීමට අවට පරිසරයෙන් කවර කරුණු හේතු වී ද යන්න සොයා බැලීම ද රෝග නිදානය නිවැරදි ලෙස හඳුනා ගැනීමට ඉවහල් වන්නකි. රෝගය හඳුනා ගත් පසුව උචිත ප්‍රතිකාර ක්‍රමය උචිත පරිදි නියම කොට බොහෝ විට සියතින් ම ප්‍රතිකාර කිරීමට අවශ්‍ය අවබෝධය ද වෛද්‍යවරයකු සතු විය යුතු සේ සැලකුණි.

මෙසේ හඳුනා ගන්නා රෝගයක් වැළඳී ඇති රෝගියකුට අවශ්‍ය ප්‍රතිකාර කරන නොයෙක් විධි සිංහලයන්ගේ වෛද්‍ය ක්‍රමයට ඇතුළත් ය. අද දක්වා මෙයින් ඇතැම් ප්‍රතිකාර විධි ප්‍රචලිත ව ඇති බව පෙනේ. රෝගියකුට පානය සඳහා දෙන ඖෂධ වර්ග මෙන් ම තෙල් වර්ග යනාදිය ඇඟ ගැල්වීම, නස්‍ය කිරීම විරේචනය යන මේ ආදී විවිධ ප්‍රතිකාර ක්‍රම දක්නට ලැබේ.

ඉහතින් දැක්වූ පරිදි සිංහල සමාජය තුළ පැවති වෛද්‍ය ක්‍රමය හුදෙක් ඖෂධ වර්ග යොද ගැනීමෙන් පමණක් ක්‍රියාත්මක වූයේ නොවේ. සිංහලයන් අතර පැවති විවිධ ඇදහිලි විශ්වාස, නක්ෂත්‍ර පිළිබඳ ඥානය හා ඊට සම්බන්ධ වෙනත් පිළිගැනීම් ද එහි ලා යොද ගැනුණි. විශේෂයෙන්ම සර්ප විෂ ශරීරගත වූ රෝගියකුට ප්‍රතිකාර කිරීමේ දී දිනය, හෝරාව, නැකත වැනි

කරුණු මෙන් ම දූත ලක්ෂණ ආදිය ද විශේෂයෙන් සැලකිල්ලට ගනු ලැබූ කරුණු විය. එම පෙර නිමිති ආදිය මගින් දෂ්ට කළ සර්පයා හඳුනා ගැනීමට නූතන සර්ප විෂ වෙදවරුන් ද සමත් වන බවට විශ්වාසයක් පවතී.

සාමාන්‍යයෙන් වෛද්‍යවරයෙක් සමාජයේ ගරු සැලකිලි ලත් වැදගත් පුද්ගලයෙක් විය. ගම තුළ ප්‍රභූවරයකු ලෙස ද ඔහු සලකනු ලැබීය. අතීත සමාජයේ වෙදවරුන් තමන් කළ සේවයට රාජානුග්‍රහය, නැතහොත් නින්දගම් හා වෙනත් වරප්‍රසාද ලත් අතර රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා අය කිරීමක් නොකරන ලදී. වර්තමාන අවධියේ වුවද ගැමි සංස්කෘතිය තුළ මෙම ආකල්පය යම් තරමක් හෝ දක්නට ලැබෙන නමුදු ආර්ථික විපර්යාසවල ප්‍රතිඵල වශයෙන් එම තත්ත්වය වෙනස් වෙමින් යන බව ද දක ගත හැකිය. වෙදවරු තම සේවය හුදෙක් තමන්ගෙන් සමාජයට ඉටු විය යුතු සේවයක් සේ සැලකූහ. රෝගියා මෙන් ම ඔහුගේ පවුලේ අය ද වෛද්‍යවරයා කෙරෙහි තබන විශ්වාසය, ගෞරවය හා භක්තිය සැලකිය යුතු තරම් විය. ගැමි සමාජය තුළ වෛද්‍යවරයකුට හිමි වූ මෙම ඉහළ සමාජ තත්ත්වයත්, සමාජයෙන් ඔහු ලද ගරු සැළකිලිත් හේතු කොට ගෙන රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ දී ඊට අවශ්‍ය සහාය ද සෙස්සන්ගෙන් නොඅඩු ව ම ඔහුට ලැබුණේ යයි කිව හැකිය.

මේ දක්වූ වෛද්‍ය ක්‍රම හා ඒවා යොද ගන්නා ආකාරයන්ට එක් කළ හැකි තවත් විශේෂ අංගයක් නම් 'කෙම්' කිරීමේ ක්‍රමයයි. මෙය මිනිසුන් විෂයයෙහි මෙන් ම ඇත්, අස්, ගව ආදී තිරිසන් සතුන් සම්බන්ධයෙන් ද ක්‍රියාත්මක වන අතර ගස් වැල් හා පැළැටි විෂයයෙහි ද බලපවත්වන ප්‍රතිකාර විශේෂයක් ලෙස හඳුන්වා දිය හැකිය. සර්ප විෂ වෙදවරුන්ට මෙම ප්‍රතිකාර විශේෂය සැබවින්ම අදාළ වෙයි. සිංහල ගැමි ජනයාගේ ගොවිතැන් කටයුතුවල දී ද විවිධ 'කෙම්' භාවිත විය.

පොදුවේ ගෙන බලන විට පැරණි කල සිට ම රෝග සමනය කිරීම සඳහා අභිචාර විධි භාවිතා කිරීම බොහෝ සමාජවල දක්නට ලැබිණ. රෝග සමන අභිචාර විධීන්හි

භාවිතයට ගන්නා ඖෂධ වර්ග විශේෂ පිළිවෙත් මත උපයෝගී කර ගැනීම නිසා රෝග නාශක බලයක් එවන් ඖෂධ සතු ව ඇතැයි යන්න මෙවැනි අභිචාර විෂයයෙහි දක්නට ලැබෙන විශේෂත්වයකි. රෝගියා තමාට පිළිවෙත් කරන අභිචාරියාගේ අනුහසට යටත් වන අතර එවැනි අවස්ථාවක දී දෙපාර්ශ්වයේ ම පරිශුද්ධතාව රැකෙන පරිදි මෙම ක්‍රියාදමයන් ඉටු විය යුතු විය. එසේ නැතහොත් එයින් අත් වන ප්‍රතිඵල අනිෂ්ට විය හැකිය. අභිචාරියකු නොමැති ව හුදු රෝගියාට පමණක් වුව ද තම රෝග සමනය සඳහා යොදා ගත හැකි අභිචාර විධි සම්ප්‍රදායානුකූල ව, වෛද්‍ය සාහිත්‍යයේ මෙන් ම ජනවහරේ ද විද්‍යාමාන වෙයි. බෝවෙන රෝගයක් වැළඳුණු කෙනකු වසන ස්ථානයෙහි ඉදිරිපස වහළයෙහි කොහොඹ හෝ අඹ අතු කැබැල්ලක් එල්ලා තැබීම අද පවා ඇතැමුන් අනුගමනය කරන සරල 'කෙමක්' ලෙස දැක්විය හැකිය. එසේ කිරීමෙන් අපේක්ෂිත ප්‍රයෝජනය නම් රෝගය පැතිර යාම වැළැක්වීමයි. මෙබඳු විශ්වාසයක් පදනම් කොට ගෙන 'කෙමක්' ලෙසින් ඉටු කරන මෙම කාර්යය විද්‍යාත්මක වශයෙන් බැලුව ද කිසියම් අර්ථවත් බවක් කියා පායි. කොහොඹ හා අඹ යන දෙවර්ගයේ ඇතැයි සැලකෙන විෂබීජ නාශක ශක්තිය මෙහි දී ප්‍රතිඵලදායක වනු ඇතැයි ද සිතිය හැකිය. මෙසේ පිළිපදින 'කෙම්' කිරීමේ ක්‍රමය මතුපිටින් නොපෙනෙන සත්‍යයක් ගැබ් වූ ප්‍රතිකාර ක්‍රමයක් ලෙස හැඳින්වීම තරමක් දුරට හෝ ඇතැම් අවස්ථා විෂයයෙහි හෝ සත්‍යයකියි කීම අපහසු නොවේ. විෂ ගෙඩි හට ගැනීම වැනි රෝගබාධ වැළඳුණු රෝගීන්ට 'අත්ත ගහ මැතිරීම' යන පිළිවෙත් ක්‍රමය පැවැත්වීම ද මීට සමාන අරුතක් හෙළි කරයි. සිය නිවසේ හෝ අසල්වැසි නිවසක හෝ වාසය කරන්නකුට බෝවෙන රෝගයක් වැළඳුණු විට නිවසේ කුඩා දරුවන් ඇතුළු සෙසු අයගේ අත්වල පෙරුම්කායම් බැඳීමේ සිරිත් රෝගයෙන් වැළකී සිටීමට උදව් වේ යයි යන විශ්වාසයෙන් ද යුතුව කරනු ලබන එක්තරා කෙම් ක්‍රමයක් ලෙස දැක්විය හැකිය.

සිංහල වෛද්‍ය ක්‍රමය ආශ්‍රිත අභිචාර, 'කෙම් ක්‍රම' යනුවෙන් හැඳින්වීම සුදුසුය. රෝග සමනය සඳහා භාවිත මෙම කෙම් ක්‍රම කාලාන්තරයක් තිස්සේ ම සිංහල ජනතාව ඇසුරේ භාවිතා වෙමින්

පැවත ආ අතර එයින් බොහොමයක් දේශීය වෛද්‍ය කෘති මගින් අද දක්වාත් ආරක්ෂා වී ඇත. එවන් එක් වැදගත් කෘතියක් ලෙස දඹදෙණි අවධියේ රචිත යෝගාර්ණවය හැඳින්විය හැකිය. මයුරපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර මාහිමියන් මෙහි කතුවරයා ලෙස දක්වෙයි[7]. මේ හිමියන් අතින් ලියවුණ තවත් කෘතියකි, ප්‍රයෝගරත්නාවලිය[8]. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සුශ්‍රැති සංහිතා, චරක, අෂ්ටාංග හෘදය වැනි වෘද්ධත්‍රයි හා මාධවය, ශාරඞගධරය, භාවප්‍රකාශ වැනි ලඝුත්‍රයි මූලාශ්‍රය මත සම්පාදනය වුව ද දේශීයත්වය රැක ගනිමින් මූලාශ්‍රයවලට නතු නොවී රචනා වූ කෘතියක් ලෙස යෝගාර්ණවය හැඳින්විය හැකිය. ලක්දිව රචනා වූ, දැනට විද්‍යාමාන ප්‍රථම සිංහල වෛද්‍ය ග්‍රන්ථය යෝගාර්ණවය වන හෙයින් එය මූලාශ්‍රය කොට පසු කලක රචනා වූ වෛද්‍ය ග්‍රන්ථ කිහිපයක් දක්නට ඇත. ප්‍රයෝගරත්නාවලිය, වරයෝගසාරය,[9] යෝගරත්නාකරය,[10] ඒ අතරට ගැනේ. ඒ අනුව දේශීය චිකිත්සා විධි පිළිබඳ කෝෂ්ඨාගාරයක් ලෙස යෝගාර්ණවය කැපී පෙනේ. සංස්කෘත වෛද්‍ය සාහිත්‍යයේ අවිද්‍යාමාන චිකිත්සක අභිචාර සේ සැලකෙන කෙම් රාශියක් මෙම කෘතියෙහි අන්තර්ගත වී තිබීම නිසා වත්මන් සමාජයෙන් ක්‍රමයෙන් අභාවයට යමින් ඇති කෙම් විධි සංරක්ෂණය කිරීමෙහි ලා ඇති අගය උත්වහන්සේ පෙන්වා දෙනුයේ දඹදෙණි අවධියේ හා තදාශ්‍රිත චකවානුවල දී චිකිත්සක අභිචාර ඒකරාශී කිරීමෙනි.

'කෙම්' යන වචනය රෝග නිවාරණය යන අරුතින් ඉපැරණි සාහිත්‍ය කෘතිවල ද යෙදී ඇත. පූජාවලිය[11], සද්ධර්මරත්නාවලිය[12] වැනි කෘතීන්හි 'කෙම්' යන්න ක්‍ෂෙමය, ආරක්‍ෂාව, රෝගනිවාරණාදිය සඳහා කරන ක්‍රියාව යන අරුත්වලින් හා මන්ත්‍ර විධියෙන් හා උපචාර කර්ම විධියෙන් කරන ආරක්ෂාව යන අරුතින් ද දක්වා ඇත. 'කෙම්' යන්න ඇතැම් විටක මඟුලට පර්යායක් ලෙස ද භාවිත වී ඇත. පුරාණ නාමාවලියට අනුව මෙය ක්‍රමය, පිළිවෙල යන අරුත් ද භාජනය කරයි[13]. සිංහල සමාජයේ කෙම්මුර දින ලෙස සෙනසුරාදා හා බදාදා යන දෙදින වෙන් ව ඇති අතර 'කෙම්වර' යනුවෙන් ද එය හැඳින්වෙයි. දෙවියන් හා භූතයන් සඳහා කරන අභිචාර ද මේ දෙදින තුළ ම කළ යුතු බවට යෝගාර්ණවය නිර්දේශ කොට ඇත.

සිංහල සමාජයේ ව්‍යවහාර වූ කෙම් ක්‍රම, මූලික වශයෙන් ඒවා භාවිත කරන ආකාරය අනුව පිළිවෙත් විධි කීපයක් මත රඳ පවතී. බොහෝ විට කෙම් ක්‍රම සමාජයේ අන්‍යයන්ට අප්‍රකාශිත අතර රහස්‍යභාවය රැක ගැනීම අකුරට ම පිළිපැදීම කෙම් ක්‍රම දත් අයගේ සිරිතකි. කෙම් පිළිවෙතක දී රෝගියා සමග වාච්‍ය සන්නිවේදනයක් නොකෙරෙන අතර චිකිත්සාවක දී ම අන්‍යයන්ට එහි විධි ක්‍රමය දැන ගැනීමට සැලැස්වෙයි. එම නිසා කෙම් ක්‍රම රහස්‍ය ඖෂධ විශේෂයක් නැතහොත් රහස්‍ය ප්‍රතිකාර ක්‍රමයක් ලෙස කෙම් ක්‍රම දත්තවුන්ගේ පරම්පරා තුළ සුරක්ෂිතව පවතී. කෙසේ වුව ද වාච්‍ය සන්නිවේදනයෙන් ඇරඹෙන කෙම් ක්‍රම ද නැත්තේ ම නොවේ.

ලක්දිව ප්‍රචලිත කෙම් ක්‍රම විවිධ වර්ගීකරණයන් යටතේ විග්‍රහයට ලක් කළ හැකි වුව ද යෝගාර්ණවයේ සඳහන් කෙම් ක්‍රම බහුල ව ඖෂධ යෝගයන් ආශ්‍රිත වම පැවැත්වෙයි. මෙම ඖෂධ සඳහා ගනු ලබන බෙහෙත් පැලෑටි අනුකරණාත්මක හා ස්පර්ශන වශයෙන් දෙවර්ගයක ලා භාවිත වෙයි. අනුකරණාත්මක යනු තමන්ගේ රෝගය හා සම්බන්ධ ක්‍රියාවලිය අභිනයෙන් දක්වා එමගින් රෝගය පහ වී යතැයි සැලකෙන කෙමකි. ස්පර්ශන යනු රෝගියාගේ සිරුරට ස්පර්ශ වන අයුරින් ඖෂධ භාවිතා කරමින් කරනු ලබන කෙම් විශේෂයකි. එබඳු කෙම්වලදී රෝගියාට පානය කිරීම සඳහා ඖෂධ උපයෝගී කර නොගැනේ. ඖෂධ පැලෑටි කවර ආකාරයට භාවිතයට ගත්ත ද මූලික පිළිවෙත් ක්‍රම මත ම එම ඖෂධ එක් රැස් කළ යුතු ව ඇත. එම පිළිවෙත් ද කෙම් ක්‍රමයේ සුවිශේෂ අංගයකි. යථොක්ත පිළිවෙත් අතරට, පෙහෙව සිටීම, ඖෂධ වෘක්ෂය පේ කිරීම හා වෘක්ෂ දේවතාවාට නමස්කාර කිරීම, ඖෂධයට හුස්ම නොවැදීමට වග බලා ගැනීම, තිරිසන් සතුන් විසින් ආහාරයට ගනු නොලැබූ දේ භාවිත කළ යුතු වීම ද අවශ්‍ය වෙයි. ඒ සමගම එම කෙම් ක්‍රම ක්‍රියාත්මක කරන කාල වේලාව සම්බන්ධයෙන් ද අනුගමනය කළ යුතු ආකාර වෙයි. තිරිසන් සතුන් ගස්වලින් බිමට බසින වේලාව මේ සඳහා යෝග්‍ය නොවේ. කෙම් කිරීමේ දී බොහෝ කෙම් ක්‍රම විෂයයෙහි අනුගමනය කළ යුතු වැදගත් ම දෙයක් නම් කථා

බෙහෙත් තොරව එය සිදු කිරීමයි. අද පවා ගැමියන් අතර මෙම පැවැත්ම කෙම් කිරීම විෂයයෙහි දක්නට ලැබේ. උදහරණයක් වශයෙන් ගතහොත් ඇස්වහ, කටවහ දෝෂවලට වතුර මැතිරීම සඳහා අලුයම් වේලේ වතුර කළයක් ළිඳෙන් ගෙන එනු ලබන්නේ කිසිවකු හා කථා කිරීමෙන් තොරව ය. මෙබඳු පැවතුම් පිටුපසින් ඇති නොයෙක් හේතූන් ද තිබිය හැකි බව පෙනේ. කථා කිරීමේ දී සිදු විය හැකි, එම කාර්‍යය කෙරෙහි අවධානය බිඳී යාම මෙහි එක් හේතුවක් විය හැකි ය. කථා කිරීමේ දී මුවෙන් කෙළ පිටවීම වැනි දේ පවා මෙම කටයුතු වලදී අපේක්ෂිත පූර්ණ පාරිශුද්ධියට හානි විය හැකි යයි සිතීම මෙහි තවත් හේතුවක් ලෙස සැලකීම අසීරු නොවේ.

ඇතැම් කෙම් සඳහා යම් යම් වෘක්ෂලතාවන්ගේ ශාඛා යොදා ගැනීමේ දී එක් එක් දිශාවනට විහිදෙන අතුපතර පිළිබඳ ව ද විශේෂයෙන් සැලකීමක් ඇත. බස්නාහිරට, උතුරට හෝ නැගෙනහිර දෙසට විහිදුණ ශාඛාවලින් හෝ වැල්වලින් හෝ පංචාංගය සපයා ගැනීම, පැලැටි ආශ්‍රිත ව කෙරෙන පිළිවෙත් රෝග සමනය කිරීමෙහි ලා බලපැවැත්වෙන ඖෂධ යොද ගැනීමේ ලා උපයුක්ත කෙම් ක්‍රම කීපයකි. මෙබඳු පිළිවෙත් රාශියක් මගින් අතීතයේ ජීවත් වූවන්ගේ විශ්වාස මෙන් ම ඒවාට පිටුපසින් වූ එක්තරා අන්දමක විද්‍යාත්මක චින්තනය ද හෙළි වෙයි. මෙම පිළිවෙත් කඩ කොට කෙම් කළ හොත් එකී ඖෂධ සතු රෝග නාශක ගුණය නැසී යන බව පිළිගත් සිද්ධාන්තයකි. තව ද ඖෂධය හා සම්බන්ධ වූ එහි අගය, වැදගත්කම පිළබඳ සංකල්පය ආරක්ෂා කර ගැනීම ද මෙහි දී අපේක්ෂිත බව පෙනේ.

ගැබිණි මවුන් සඳහා පැවැත්වෙන චිකිත්සක අභිචාර විධි කීපයක් මෙසේ ය. ගැබිණියකගේ ප්‍රසව වේදනා දුරු කොට දරු ප්‍රසූතිය පහසු කරවීම සඳහා පැවැත්වෙන අභිචාර අතරට සිංහල සමාජයේ ප්‍රචලිත ඉපැරණි ම අභිචාරය නම් අංගුලිමාල පිරිතෙන් සෙත් කර එම පිරිත් පැන් ඇයට පානය කිරීමට සැලැස්වීමයි.

"අඟුල්මල් තෙරුන් පිරිත් බණන්නට හුන් අස්න
සෝධා හැරගත් පැන් සියලු උවදුරු නසයි
පිරිත් බිණූ පැන් බී ප්‍රසව වේදනා නැතිවැ
දරුවන් වදතියි .......................... "[14]

යනුවෙන් සද්ධර්මරත්නාවලියේ කාළි යක්ෂිණී වස්තුවේ සඳහන් වෙයි.

පශ්චාත්කාලීන වෛද්‍ය ග්‍රන්ථයක් වූ වරයෝගසාරය ද පිරිතෙන් සෙත් කිරිම දරු ප්‍රසූතියක දී කිරීමට සුදුසු වූවක් ලෙසට අනුදන ඇත.

"නමො ලොචනමමාකී පඬරවාසිනී සමයකතා නාම
මම එසවා හඃ- මෙයින් අටතුරාසියක් දපා රුවන් සූත්‍රය
පිරුවා පැන් දුන් සුවසේ ප්‍රසූත කෙරේ.

"ඕං නමෝ අංගුලිමාලො මහා ථෙරො මහාවීරො
මහාබලො ගබහිණී විසෙසන ගබෙහා
නිකකමනතු ස්වාහඃ - තලතෙලට නව විටක් දපා බඩේ
පාතට ගානු වහා වදයි[15]

යෝගාර්ණවයේ පිරිතින් සෙත් කිරීමට ඇනුදන නැති අතර මන්ත්‍රයක් සේ සැලකෙන වාසගමක් නව සැරයක් ලාස්සක් පිට සිරියල්වලින් ඇඳි යන්ත්‍ර විශේෂයක් දකුණු පැත්තට හරවා දරු නිමිත්ත යට තැබීමට උපදෙස් යෙදී ඇත.

"එකෙක් අටි තුන් දවසින් යොදුන් යන්නට නවතා දෙපා
වුවෙන් සතින් සයින් පසු කරන්නට යන මේ ගීයෙහි නව
සංඛ්‍යාව ලාසුපිට සිරියලින් නව ගැබක් ඇද ඉන්ද්‍රාවෙහි
පටන්
දක්ෂිණාවෘත්ත කොට ඇද දරු නිමිත්තයට පානේ වහා
වදත්"[16]

ගැබ තුළ වූ ළදරු මරණයක දී දරුවා ප්‍රසූත කරවීමෙහි ලා නොපිදුණු තියඹලා වැලක් එක පහරින් කපා ගෙන වළල්ලක් සාද ඉසින් පාතට හෙළාගෙන පිරිස නැති දිසාවට වළල්ල පැන්න වීමෙන් පසු රෝගියා කෙළින් සිටුවා මළ දරුවා බිම හෙළීමේ කෙම් ක්‍රමයක් සේ.

"නුපුන් තියඹලා වැලක් එක පහරින් කපාගෙන වළල්ල දෙඅග ඊ ඊ තබා නමා ඉසින් පාත හෙළා ආදී මී දළු ඉස්ම මුදුන් ගන්වා පිරිස නැති දිසාවට වැල් වළල්ල පන්වා කෙළින් සිටවනු දරුවෝ වැටිහෙත්"[17]

ඖෂධ පැළැටි ද්‍රව්‍ය උපයුක්ත කර ගෙන රෝගී කාන්තාවට ස්පර්ශ කරවීමෙන් දරු ප්‍රසූතිය පහසු කරවන කෙම් ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

"සුසුම් නොලා හෙළ නිටුල් මුලක් උදුරාගෙන ඇඟ නොවකා දුවනු පිස දුර තබනු වහා වදත්."[18]

"වල්ලා අත්තක් මුවෙන් නොබැණ කඩාගෙන ඇඟ පිස පා පිස පාමුල තබනු."[19]

දරුවන් නොමැති කතුන්ට දරු එල සඳහාත් පුත්‍ර ලාභය සහ දුහිතෘ ලාභය සඳහාත් ඉපැරණි කෙම් ක්‍රම කීපයක් ඇත. ඒ අතර පැළැටිවලින් යුක්ත කෙම් ක්‍රම මෙන් ම ලූල් මත්ස්‍ය උපයුක්ත කර ගත් කෙමක් ද ඇත. විශේෂයෙන් සිංහල සමාජයේ පිළිල සෑදීම වෘක්ෂයට අහිතකර සේ සැලකුණ ද බුලත් පිළිල, ගොයම් පිළිල වැනි පිළිල සෞභාග්‍යයේ සංකේතයක් සේ සැලකීම දක්නට ලැබෙන අතර එවන් වෘක්ෂ පිළිල ද කෙම් ක්‍රම සඳහා භාවිතා වූ බවට සාධක ඇත. දරු එල පතා "බෝ පිළිල රේවතී නැකතින් ගෙන අතින් අල්ලාගෙන සිටීම."[20] පුත්‍ර ලාභය හා දුහිතෘ ලාභය සඳහා ලප්තැල්ල හෝ නුග දළු හෝ වරාකිරි මැඩ සතර බින්දුවක් සෘතු ගෙනෙන ද පුතුන් කැමැත් දකුණු නාසාපුටයේ දුන් කැමැත්ත වම් නාසා පුටයේ නශ්‍ය කරනු දරුවෝ සිටිත්"[21] යනුවෙන් කෙම් ක්‍රමයක් ද හඳුන්වා දෙයි.

දරුවන් සිටින මාතාවකට හා කාන්තා රූප සෞන්දර්යටත් ඉවහල් වන්නකි, කුඩාත් නොවූ විශාලත් නොවූ පියවුරු පිහිටීම. ඒ නිසා විශාල පියවුරු කුඩා කර ගැනීමට භාවිත වූ කෙමක් සේ පොල් බිඩලක් බිම නොදමා කඩාගෙන හෙළ කිරින් අඹරා බිම නොබලා පියවුරුවල අලේප කිරීම.

> "තන කුඩා කරත් පොල් බිඩලක් බිම නොබා හෙළා කඩාගෙන
> පොතු හෙළ කිරින් අඹරා බිම නොබලා තනයේ ගානු පියවුරු කුඩා වේ.[22]

මිනිසාට වැළඳෙන රෝග විවිධ විය හැකිය. ආයුර්වේද මතය අනුව වා පිත් සෙම් යන තුන්දෙස් කිපීම නිසා මිනිසාට නොයෙකුත් රෝග හට ගනී. ඒ ඒ දෝෂයෙන් ජනිත රෝගයනට හිත ඖෂධ වර්ග ද්‍රව්‍ය විඥානය මත වෛද්‍යවරයා හඳුනා ගනී. එසේ වුවත් යම් පිළිවෙත් මත බෙහෙත් ඖෂධ ලබා ගැනීම හා පානය කිරීම නිසා රෝග සමනය වඩාත් පහසු කරවීම සඳහා මේ පිළිවෙත් පැරැන්නන් උපයුක්ත කර ගත් බව පෙනේ. ඖෂධ ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙත් කීපයක් මෙසේ පහද දේ.

> "සරක් නොකෑ මිනිසුන් නොගැවසෙන මොල්සන් නොඇසෙන නෙතින් තුපුන් සීත් මැඩහගු වැලක් පායා සුදුවැලි තවරා පත් තුනක් බත්පිඩි තුනක් පාන්කඩ තුනක් ගඳ දුම්මල් පහන් පුද වෘක්ෂ දේවතාවට ආරාධනා කොට අඟහරුවාද නිරන්තරයෙන් ගස උදුරා ගෙන"[23]

රෝග සමනය සඳහා මස් මාංස නැති නම් සත්ව අවයව භාවිත කරමින් කරන කෙම් ක්‍රම රැසක් සිංහල සමාජයේ ව්‍යාප්ත ව පවතී. යෝගාර්ණවයෙහි සඳහන් එවන් කෙම් ක්‍රම කිහිපයකි. ආහාර පිණිස මස් මාංස යොදා ගැනීම රෝගයක දී කෙමක් ලෙස සැලකේ. විශේෂයෙන්ම ළදරු රෝග විෂයෙහි පූතනා ග්‍රහ දෝෂවලට මස් මාංසවලින් බිලි දීමේ එක්තරා අභිචාර ක්‍රමයක් ද හඳුනා ගත හැකිය. දරුවන් පතා කාන්තාවන්ට ලූල් මාළු කෑමට දීම, ශිරෝ රෝග විෂයෙහි දියලිහිණි මස් රස දීම ද ක්ෂය රෝගීන්ට එළු මස් උපයෝගී කර ගැනීම, එළු වැදමහා කුළුබඩු

තවරා කෑමට දීම වැනි අවස්ථා රාශියක් ඇත. එමෙන් ම ක්ෂය රෝගීන්ට වඳුරන් පෙන්වා ලුහුබැඳවීමට සැලැස්වීමත් එළුවන් අතරේ සිටීමට සැලැස්වීමත් ක්ෂය රෝගය සඳහා උපයුක්ත ප්‍රතිකාරයකි.

"ශෝක සිතින් වූ ක්ෂය රෝගීනට නෘත්‍යගීත වාද්‍යදියෙන් නිත්‍යයෙන් සතුටු කරවනු එළුවන් අතුරේ සිටවනු වඳුරන් දක්වා ලුහු බඳවනු ස්ත්‍රීන් හා සිපගන්වනු.........."[24]

සත්ව ද්‍රව්‍ය උපයෝගී කර ගත් ඇතැම් කෙම් ක්‍රම ද යම් යම් රෝග නාශනය සඳහා යොදා ගැනේ. අපස්මාර රෝගයේ දී මීගොනකුගේ පිත වියළා තබා මී කොළ යුෂයේ පොඟවා අපස්මාරය වැළඳි විට නශ්‍ය කිරීමට අනු දන ඇත. ඇතැම් විට මිනිස් සිරුරේ අංග ද කෙම් ක්‍රම සඳහා උපයෝගී කර ගත් බව පෙනේ. අපස්මාර රෝගයේ දී බෙරවා කුලයට අයත් කාන්තාවක් කුළුඳුලේ දරු ප්‍රසූතියෙන් ලත් වැදෑමහ රැගෙන වියළා හිස් මුදුනේ දමා පොරවා අත ගැස්සවීමේ කෙම් ක්‍රමයක් ප්‍රචලිත ව පැවතී ඇත.

"බෙරවා දුවක කුළුඳුලේ දරු ලද වැදෑමස ගෙන වියළා තඹයෙන් හිස් මුදුනේ ලා හොරවා අල්ලනු"[25]

තරුණ මී වස්සන්ගේ උයද ගොම, සාබෙට්, බසු වසුරු හෝ මුත්‍ර, පක්ෂීන්ගේ පිහාටු වැනි දේ පවා කෙම් ක්‍රම සඳහා උපයෝගී කර ගත් බවට සාධක ඇත.

ඇතැම් රෝග විෂයයෙහි පැළැටි ඖෂධ රෝගියාගේ ශරීරයට ස්පර්ශ කර කරනු ලබන රෝග සමන අභිචාර විධියක් ඇති අතර ඒ සඳහා ඖෂධ ගැනීමේ දී පූර්වයෙන් සඳහන් කළ පිළිවෙත්හි මනාව පිහිටිය යුතුවා සේ ම ඒ අභිචාරය කරන්නාත් රෝගියාත් පෙහෙ වී සිටීම අනිවාර්යය.

"එරබදු ගසක් පායා පඤ්චෝපචාර කොට, මේ ගස දෙවියාණෙනි! නුඹගෙන් ගන්නා ඖෂධය සිද්ධය. සෙට යුද්ධයට එකෙක් එයි. ඔහු පරදින බව නියතය. ඔහු පැරදී කල නුඹවහන්සේට මෙතෙක් මල් පුදමියි යැද ගොස් එසේ ම කියා උදය පොත්තක් ගෙන අත තබා බෝපතින් වසා නුපුන් පෙණෙල වැලකින් බඳිනේ.........[26]

රෝග සමනය සඳහා ඇතැම් විටක පැළැටි උපයෝගී කර ගැනීමේ දී කෙම් ක්‍රමයට අයත් පිළිවෙත්හි පිහිටා සිරුරට ස්පර්ශ කිරීම හෝ ඖෂධ පානයක් නොකෙරෙන අතර එම ගසින් කොළයක් කඩා දමා යාම, අත්තක් කඩා යාම, ගස් වැල් උදුරා බිම දමා යාම වැනි කෙම් ක්‍රම කිහිපයක් ද හඳුන්වා දෙයි. කුදාති රෝගයේ දී කුකුරුමුවන් ගස පිළලය කපා දැමීම එවැනි චිකිත්සා අභිචාරයකි.

"කුකුරුමුවන් ගස පිළිල කුදාතිය නැතිවන්ට කියා එක පහරින් කපනු........[27]

මේ රෝගය සඳහා ම නොපිදුණු මී ගසක අත්තක් කථා නොකර කෙම්මුර දිනක මව්පියන් හා රෝගියා සිහි කර කඩා බිම දැමීම ද ඇතැම් විට කෙරේ.

මුඛ රෝග විෂයෙහි දත් දිරා යාමට හේතු වන දත්වැයාට කරන කෙමක් සේ රෝගියාගේ පියාගේ මවගේ සහ රෝගියාගේ නම සිහි කර වන නැඹිලිය හෝ උළුපියලි රත්මානිස්ස හෝ උදුරා එම ස්ථානයේ ම දමා යාමයි.

"අසවලුට ද අසවලු බඩ හොත් අසවලාට දන්වා මෙතෙක් කලට නැතැයි කියා නව නැඹිලිය හෝ උළුපියලි හෝ රත්මානිස්සස හෝ උදුරා එම තෙන හෙළ යනු.......[28]

"ආයුර්වේද චිකිත්සා ක්‍රමය අනුව නශ්‍ය කිරීම ස්වේදකර්ම වැනි පංචකර්ම චිකිත්සා විෂයයෙහි ඒ ඒ රෝගයට හිත සේ දන්වා ඇත. එම නශ්‍ය කිරීම හා ස්වේදය හෙවත් දුම් ගස්වා ඩහදිය නැංවීමේදීත් ඖෂධ පැළැටි භාවිතය කෙම් ක්‍රම මත ගත යුතු බව යෝගාර්ණවය නිර්දේශ කරයි.

> "හිසේ සහ නළලේ හට ගත් වේදනා සමනය පිණිස නුපුන් පුෂ්ට සමන් මුලක් මුයෙන් නොබැණ උදුරා තොටපියල්ලේ ඔතා තලතෙල් හන රැජාවට පා නිවා දුම් නාසයෙන් උරවනු......."[29]

රෝග සමනය සඳහා රෝගීන්ට දිය යුතු ඇතැම් බෙහෙත් ආහාර ද කෙම් ක්‍රම මත සකසා ගත් බැවින් එවන් ආහාර වැළඳීමෙන් රෝදුක් දුරු වෙතැයි යන ආකල්පයක් පැවති බව පෙනේ.

ඇතැම් රෝග විෂයයෙහි වාචික ව පවත්වන ලද කෙම් ක්‍රම කිහිපයකි. ඒවා අතරට විටක ඖෂධ වර්ග අයත් වේ. මන්ත්‍රයක් මතුරා හෝ වෙනත් චූර්ණිකාවක් කියා හෝ මේ කෙම් ක්‍රම කරන අතර වරෙක ගසක අත්තක් කපා දැමීම හෝ අභිචාරියාගේ හිනේ වස්ත්‍රයේ නෙරිපටේ රෙදි කඩක් ගැට ගසා වාචික ව කෙරෙන කෙම් රැසකි.

> "අඹලවාදයිඩ්"* යයි කියා ආ විට ම තමා අත්කඩයට කුරුගුලාව*[1] වමතින් ගැට ගසා පෙකණිය ඉද්දේ ගන්වා තුනුරුවන් අණ වැළැක්ක නැතැයි කියා යවනු"[30]

මෙයට අමතර ව ගෙඩි වුණ විසයෙහි හා බාල රෝග විෂයෙහි මෙන් ම සර්ප විෂ සඳහා භාවිත යන්ත්‍ර මන්ත්‍ර විධි රැසකි. එකී මන්ත්‍ර ජප කිරීමේ දී රෝගියා තුළ මානසික වශයෙන් බලපෑමක් කෙරෙන අතර ඒ තුළින් රෝගියා ගේ චිත්ත සමනය වීමක් ද සිදු වේ. රෝගියාට බෙහෙත් ඖෂධ එතු ඉදල් හෝ කැති වැනි ආයුධවලින් පහර දීම දක්නට ලැබේ. එලෙසින් පහර දී රෝග සුව කිරීමට උදහරණ සේ අපස්මාර රෝගය වැළඳගෙන එන විට සෘතු වූ ස්ත්‍රියක ලවා පහත සඳහන් ඖෂධ වර්ග ගෙන්වා ගෙන ඉදලක බැඳ රෝගියාගේ මුහුණට ගැසීමට සැලැස්වීම දක්විය හැකිය.

---

* අතීසාර රෝග ප්‍රභේදයකි.

*1 නෙරිපට

"නුපුත් ඇසළ වැල්පෙණෙල බැලිල මේ තුන්මුල් උතුනී කෙනෙකුන් ලවා ගෙන්වා ඉලපත තබා බැඳ වස්මර සෙලවුන විට ඉලපත මුණ ගසනු..........."[31]

උදර රෝග විෂයයෙහි දී භාවිතයට ගත් කෙමක් ලෙස,

"තෝවැල්ල වැලක් මුල හැස කනපාහුය වට බැඳ පඤ්චෝපචාරයෙන් පෙහෙ කොට කැත්තක් ඊ මත තබා තමා ද පෙහෙව කෙම්වර ද ආතුරයා කැඳවා බඩ ගසාලා මේ රෝගය මා කපන්නේය. වැල නැතිවන්නා සේ රෝගයත් නැති වේවා! යි කියා වැල එක පහරින් ගසා කපා කැත්තත් ඒම තැන ම දමා පසු නොබලා යනු. ඇනිකකු ලවා කැත්ත ගෙන්වනු"[32]

ඒ රෝගයට ප්‍රතිකාර පිණිස ගත් පැළැටි ඖෂධ වර්ග අන්‍යයනට ස්පර්ශ නොවන ලෙස දුමක හෝ වක්කඩක සඟවා තැබීම සිදු කෙරේ. දුමේ තැබීමෙන් වේලී ගිය පැළැටිය මෙන් රෝගය සුව වීමත් වක්කඩ සඟවා පැළැටි කුණු වී යන්නා සේ රෝගය සුව වීමත් අපේක්ෂා කළ අතර අන්‍යයන්ට එකී ඖෂධ ද්‍රව්‍ය ස්පර්ශ වීම නිසා රෝග බෝවෙතියි යන විශ්වාසයක් ද පැවති නිසා ඒ සම්බන්ධයෙන් වඩාත් පරීක්ෂාකාරී වූ බව පෙනේ.

"පිලාවේ විවරට වැල සුම්මාඩියක් සේ හකුළුවා පිලාව පිට තබා ඩා සෙලවෙන තුරු මුයෙන් නොබැණ වැඩ වැල හැරගෙන පසු නොබලා ගොස් වක්කඩෙක මඩ යට ගන්වනු. වැල කුණුවත් පිලාව ගුණ වේ.........."[33]

සිංහල සමාජයේ ප්‍රචලිත මෙම අභිචාර විධිවලින් හෙළි වනුයේ අනාදිමත් කාලයක සිට ප්‍රචලිත ව පැවති ප්‍රතිකාර විධියි. මෙම කෙම් ක්‍රම කෙතරම් සමාජයේ ජනප්‍රිය ව පැවතියේ ද යතහොත් යෝගාර්ණව කතු හිමිපාණන්ට කෙම් ක්‍රමවලින් විනිර්මුක්ත ව ස්වකීය කෘතිය සම්පාදනය කළ නොහැකි විය. මේ නිසා සමාජයේ ආදි කාලීන වැසියනගේ ඇදහිලි හා විශ්වාස පිළිබඳ ව පැවති සංස්කෘතිකාංග කිහිපයක් හෙළිදරව් වේ.

චිකිත්සක අභිචාර ලෙස යොදා ගත් මේ කෙම් ක්‍රමවලින් බොහෝ දුරට රෝග සමනය වෙතැයි යන ආකල්පය වඩා ප්‍රචලිත විය. එසේ වනුයේ යම් පිළිවෙත් මත ඖෂධ ද්‍රව්‍ය ලබා ගැනීම නිසාය. ශුභ මොහොත නැතිනම් නැකත් වෙලාවට මෙම ද්‍රව්‍ය ලබා ගැනීම රෝගියාගේ මෙන්ම අන්‍යයන්ගේත් සිත් සතන් තුළ ගුඪ ව පැවති සොම්නස් භාවය එයට හේතු වුවාට සැකයක් නැත. ස්ථිර අධිෂ්ඨානයක් එක එල්ලේ ම රෝගියා තුළ ජනනය වීම නිසා මානසික සන්තෘප්තියක් රෝගියා කරා ළං වේ. ඇතැම් විටෙක ඒ සන්තෘප්තිය ම රෝග සමනයට උපයුක්ත විය හැකිය.

කෙම් ක්‍රමවල මූලික අභිප්‍රාය වනුයේ කවර ක්‍රමයකින් හෝ රෝගය සමනය කිරීමයි. ඒ සඳහා උපයුක්ත කර ගන්නා බෙහෙත් ද්‍රව්‍ය යම් යම් පිළිවෙත් මත ලබා ගැනීම වැනි ක්‍රියා තුළින් පැරණියන්ගේ විද්‍යාත්මක ඥනය පිළිබිඹු වේ. එක් ක්‍රමයක් අසාර්ථක වූ විට විකල්ප වශයෙන් තවත් කෙම් ක්‍රමයක් බෙහෙත් ද්‍රව්‍ය ඌන පූර්ණය කිරීමෙන් යොදා ගැනීමට අනු දනී. ඒ නිසා ඖෂධ පිළිබඳ පිළිවෙත්වල අත්හදා බැලීම් ක්‍රමයෙන් වර්ධනය වීම ස්වභාවිකය.

වෘක්ෂලතා හා ජනයා අතර පැවති සමවාය සම්බන්ධය අනෙකයි. පැරණි සමාජයේ වෘක්ෂලතාදිය ජනතාවගේ කුදු මහත් ඕනෑ එපාකම් සැමකට ම අවශ්‍ය විය. එම නිසා ප්‍රාථමික ජනයා වෘක්ෂලතා දේවත්වයෙන් සැලකූ අතර එවන් රුක්වලට අධිගෘහිත දේවිදේවතාවුන් ඇතැයි පුද පූජා කිරීම ද කෘතගුණ සැලකීමක් වශයෙන් කෙරුණකි. එම ප්‍රාථමික දැනුම් සම්භාරය ද රෝග සමනය සඳහා කඩින් කඩ ඉවහල් වූ අවස්ථා පූර්වෝක්ත කෙම් විධිවලින් ප්‍රකටිභූත වේ.

කෙම් ක්‍රමවල දී අනුකරණාත්මක ව පැවැත්වෙන පිළිවෙත්වල දී රෝගියා ගේ සිරුරෙන් රෝගය පහ කිරීම අභිනයෙන් කිරීමක් දිස් වේ. ගසක හෝ නැති නම් පැළෑටියක අතු හෝ වැල් කපා දමන්නා සේ සිරුරින් රෝගත් ඉවත් වේය යන ආකල්පය පැවති බව පෙනේ. මෙවන් ක්‍රම පිළිවෙත් තුළින් රෝගය ඉවත් කිරීමක් හෝ වෙනත් තැනකට තල්ලු කර දැමීමක් දෘශ්‍යමාන වේ.

මේ සියලු ම කෙම් විධි විග්‍රහයට ලක් කර බැලීමේ දී රෝගියාගේ සහ අන්‍යයන්ගේ සිත් සතන් සන්තර්පණය කිරීමට ඖෂධ වර්ගවල පවත්නා රෝග නාශක බලයත් ඖෂධයන්හි ශ්‍රේෂ්ඨත්වයත් පෙන්වීමට මෙම චිකිත්සක අභිචාර උපයුක්ත කර ගෙන ඇත. මෙහි දී සුප්‍රකට මානව විද්‍යාඥයකු වන රේමන්ඩ් ෆර්ත්ගේ අදහස් කීපයක් දැක්වීම වැදගත් වෙයි. පළමුවෙන් ම අන් හේතූන් නිසා හෝ සිදු කරනු ලබන කටයුත්තෙහි නැතිනම් භාවිත කරනු ලබන බෙහෙත්වල වැදගත්කමක් ඇති බැවින් හෝ අභිචාර කටයුතු වලින් බලාපොරොත්තු වන ඇතැම් ප්‍රතිඵල ඇත්ත වශයෙන් ම හට ගනී. බලාපොරොත්තු වන අරමුණු ඉටු කිරීමට වෛදික ක්‍රියාවකට නොහැකි වුවහොත් නියම අවශ්‍යතාවන් පිළිබඳ නොමැති බව හෝ අන් කෙනෙක් අභිචාර මගින් එයට විරුද්ධ වී ඇතැයි හෝ තර්ක කරනු ඇත. මෙම සිද්ධාන්තය බොහෝ දුරට ලංකාවේ පැවැත්වෙන චිකිත්සක අභිචාර සේ සැලකෙන කෙම් ක්‍රම පිළිබඳ ව ද බෙහෙවින් සාධාරණ යයි හැඟේ. සිංහලයා සතුව පැවති දියුණු වෛද්‍ය ක්‍රම අතර දක්නට ලැබෙන එක් අභිචාර විධියක් වන කෙම් ක්‍රම විෂයයෙහි සමස්ත වශයෙන් ගෙන බලන විට පෙනෙන වැදගත් අරමුණු දෙකක් ඉස්මතු වන අයුරු මෙම විග්‍රහයෙන් දැක්වෙයි. රෝගියාගේ කායික සුවය මෙන් ම මානසික සන්තුෂ්ටිය ද එම අරමුණු දෙක ලෙස හැඳින්විය හැකිය.

## පාදක සටහන්

1. පණ්ඩුකාභය රජු නගරය නිර්මාණය කොට 'සොත්ථිශාලා' යනුවෙන් හැඳින්වුණ ආරෝග්‍ය ශාලාවක් කරවූ බව මහාවංශයේ දක්වෙයි.

   **මහාවංශය**. X පරිච්ඡේදය, 102 ගාථාව.

2. Archaeological Survey of Ceylon Annual Report No. 2 p. 94
3. Journal of the Royal Asiatic Society Ceylon Branch New Series, Vol II, p. 136
4. **චූලවංශය** XXXvii පරිච්ඡේදය, 112 - 113 ගාථා.
5. **ගිරා සන්දේශය**. (සං) මකුලුදූවේ පියරතන, 1952, 22 පද්‍යය
6. 'මිත්‍යා විශ්වාසයන්ට පදනම් වූ විද්‍යාව', මාපලගම සිරි විමල හිමි,

   **සාහිත්‍යය**. 1965, 4 කලාපය, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, 64 පිට

7. **යෝගාර්ණවය**. (සං) කිරිඇල්ලේ ඥාණවිමල හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම 1963.
8. **ප්‍රයෝගරත්නාවලිය**. (සං) කිරිඇල්ලේ ඥාණවිමල හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම 1943.
9. **වරයෝගසාරය**. (සං) කිරිඇල්ලේ ඥාණවිමල හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම 1966.
10. **යෝගරත්නාකරය**. (සං) දොන් ජෝජ් සමරතුංග රන්දුනු, ශ්‍රී ලංකාදය යන්ත්‍රාලය, 1907.
11. **පූජාවලිය**. (සං) තෙන්නකෝන්, 1969, ශ්‍රී ලංකා ප්‍රකාශන සමාගම, 281 පිට
12. **සද්ධර්මරත්නාවලිය**. (සං) ඩී. බී. ජයතිලක ස්වදේශී මිත්‍රයා යන්ත්‍රාලය, 152 පිට

13. පුරාණ නාමාවලිය. (සං) හේන්ද්‍රික් ජයතිලක, 1923, 183 පිට
14. සද්ධර්මරත්නාවලිය. 93 පිට
15. වරයෝගසාරය. 50 පිට
16. යෝගාර්ණවය. 30 පිට
17. - එම - 239 පිට
18. - එම - 30 පිට
19. - එම - 29, 30 පිට
20. - එම - 29 පිට
21. - එම - 28 පිට
22. - එම - 246 පිට
23. - එම - 154 පිට
24. - එම - 102 පිට
25. - එම - 105 පිට
26. - එම - 85 පිට
27. - එම - 41 පිට
28. - එම - 76 පිට
29. - එම - 40 පිට
30. - එම - 96 පිට
31. යෝගාර්ණවය. 105, 106 පිටු
32. - එම - 156 පිට
33. - එම - 154 පිට
34. රේමන්ඩ් ෆර්ත්, මානව ප්‍රභේද. පරිවර්තනය - ජී. වීරසේකර, රත්නාකර ප්‍රකාශක, 131 පිට